# විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය

**නිපුණතාව - ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි**

**නිපුණතා මට්ටම - මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයන් ලද දායාද හැඳින ඒවා ශාසනික හා සංස්කෘතික වශයෙන් ඇගයීමට ලක් කරමින් සංරක්ෂණය කරයි**

**පාඩම -19 පාඩම- මහින්දාගමනයෙන් අප ලත් දායද**

## 19 පාඩම

## මහින්දාගමනයෙන් අප ලත් දායද

## I - කොටස

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1. අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කරන ලද්දේ

    1. වෙසක් පොහෝ දිනකදීය  2. ඇසල පොහෝ දිනකදීය

    3. පොසොන් පොහෝ දිනකදීය  4. උඳුවප් පොහෝ දිනකදීය

2. සිව්වන ධර්ම සංගායනාව සිදු කරන ලද්දේ

    1. මාතලේ අළු විහාරයේදීය  2. සප්ත පර්ණි ගල් ගුහා ද්වාරයේදීය

    3. පැළලුප් නුවර අශෝකාරාමයේදීය  4. විශාලා මහා නුවර වාලුකාරාමයේදීය

3. බෞද්ධ සාහිත්‍යයේ ශාරීරික චෛත්‍යය මූලික කරගත් පුද පූජා ක්‍රමයකි .

    1. බෝධි පූජාව  2. බුදු පිළිම වන්දනාව

    3. දළදා පූජාව  4. දේව පූජාව

4. මහින්දාගමනයෙන් පසු මෙරට සාහිත්‍ය කෘති බුදු දහමින් පෝෂණය විය .ඒ අනුව බිහි වූ පද්‍ය සාහිත්‍ය කෘතියකි .

    1. බුත්සරණ  2. අමාවතුර

    3. සද්ධර්ම රත්නාවලිය  4. සසදාවත

5. උඳුවප් පුර පසළොස්වක පොහෝ දින සිදු වූ වැදගත් සිදුවීමකි .

1. මිහිඳු හිමි ලංකාවට වැඩම කිරීම  2. සංඝමිත්තා තෙරණිය ලංකාවට වැඩම කිරීම

3. බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාව පැවැත්වීම  4. බෝසතාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කිරීම

# 19 පාඩම

අධ්‍යාපන අමාත්‍යාංශය
ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

**කෙටි පිළිතුරු සපයන්න.**

1. මිහිඳු මහාරහතන් වහන්සේ සමග ලංකාවට වැඩම කළ පිරිස නම් කරන්න
2. මහින්දාගමනයට පෙර ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස 2ක් ලියන්න
3. ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න
4. බුදු දහම ඇසුරින් පෝෂිත ගද්‍ය සාහිත්‍ය කෘති හතරක් ලියන්න
5. මහින්දාගමනයෙන් අප ලත් දායාද යන මැයෙන් ලිපියක් සකස් කරන්න

## 19 පාඩම

## මහින්දාගමනයෙන් අප ලත් දායද

## පිළිතුරු - කොටස I

1. පොසොන් පුර පසළොස්වක පොහෝ දිනකදීය .
2. මාතලේ අළු විහාරයේදීය .
3. දළඳා පූජාව
4. සසදාවත
5. සංඝමිත්තා තෙරණිය ලංකාවට වැඩම කිරීම .

## පිළිතුරු - කොටස II

1. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල මහ රහතන් වහන්සේ, සුමන සාමණේර වහන්සේ, භණ්ඩුක උපාසක
2. මළවුන් ඇදහීම, දෙවියන්ට පුද පූජා පැවැත්වීම , ගස් ගල්වලට වැඳුම් පිදුම් කිරීම .
3. ශාරීරික චෛත්‍ය, පාරිභෝගික චෛත්‍ය , උද්දේසික චෛත්‍ය
4. සද්ධර්ම රත්නාවලිය , බුත්සරණ , අමාවතුර , පන්සිය පනස් ජාතක පොත
5. බුදු දහමින් පෝෂණය වූ, ආගමික සංස්කෘතික දායාද පිළිබඳ සුදුසු පරිදි දක්වා තිබීම



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල